**ශීර්ෂය 265 - මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 265- මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූනි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් 04ක ආරම්භක ශේෂය එකතුව රු.1,204,125,232කින් වැඩියෙන් දැක්වීමෙන් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නිවැරදි වටිනාකම ඉදිරිපත් කරනු ලබන බව | මූල්‍ය නොවන වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්වල දැක්විය යුතු වේ. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වර්ග අඩි 2,625කින් යුත් ඉඩමෙහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත නොකිරීමෙන් මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වත්කම් සඳහා තක්සේරු වාර්තා ඉල්ලීම් කර ඇත. එසේ වුවත්, මේ දක්වා තක්සේරු වාර්තා ලැබී නොමැත. තක්සේරු වාර්තා කඩිනමින් ලබා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළයුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයන් 02ක් සහ මූලධන වැය විෂයන් 05කට සැලැසුම් කළ පරිදි භාණ්ඩාගාරය විසින් අග්‍රිම නිකුත් නොකිරීමෙන් රු.111,242,752ක මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකිවී තිබූ බව නිරීක්ෂණය විය. | අප විසින් අග්‍රිම ඉල්ලීම් නියමිත දිනවල සිදුකළ නමුත් භාණ්ඩාගාරය විසින් ප්‍රමාණවත් අග්‍රිම නිදහස් නොකිරීමෙන් මූල්‍ය ප්‍රතිපාදනවල ඉතිරිවීම් පැවැති බව. | නියමිත කාලය තුළ ප්‍රතිපාදන වෙන්කර අග්‍රිම ලබාගැනීමට පියවර ගත යුතුවේ. |

### 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැය විෂයන් 23ක වෙන් කළ ප්‍රතිපාදන එකතුව රු.167,414,638ක සියයට 07 සිට | වියදම් සිදුකිරීමේ පිරිමැසුම්දායක බව හා භාණ්ඩ හා සේවාවන්වල මිලගණන් වැඩිවීම හේතුවෙන් ඒවා ලබාගැනීමේ බාධාවන්, ප්‍රවාහන දුෂ්කරතා මතුවීම | නිවැරදි අයුරින් ඇස්තමේන්තු සිදුකර අයවැය තාර්කික ලෙස සකස් කිරීමට පියවර ගත |

| | | | |
|---|---|---|---|
| | සියයට 100ක් දක්වා පරාසයකින් ඉතිරිවීම් පැවතුණි. | වැනි හේතූන් නිසා ප්‍රමාණාත්මකවූ කාර්යයන් ඉටුකළ නොහැකි තත්ත්වයක් ඇතිවීමෙන් අදාල ඉතිරිවීම් සිදුවූ බව. | යුතු වේ. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැය විෂයන් 04කට වෙනත් වැය විෂයන්ගෙන් එකතුව රු.19,590,000ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව මාරුකර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසානයේ එසේ මාරු කරන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.7,380,273ක් හෙවත් සියයට 02 සිට සියයට 14ක් දක්වා පරාසයකින් ඉතිරි වීම් පැවතුණි. මේ අනුව අදාල මාරුකිරීම් අවශ්‍යතාවයට අනුකූලව කාර්යක්ෂම ලෙස උපයෝජනය කර නොතිබූ බව නිරීක්ෂණය විය. | රටෙහි පැවැති ආර්ථික දුෂ්කරතා සහ මූල්‍ය හිඟය හේතුවෙන් දිනෙන් දින භාණ්ඩ හා සේවාවන්ගේ මිලගණන් ඉහළයාම, ඒවා ලබාගැනීමේ බාධාවන්, ප්‍රවාහන අපහසුතා ආදිය හේතුවෙන් ප්‍රමාණාත්මකවූ කාර්යයන් ඉටුකළ නොහැකි තත්ත්වයක් ඇති වූ බව. | සම්පූර්ණ ලෙස හා තාර්කිකව ඇස්තමේන්තු පිළියෙල කිරීම කළ යුතු අතර, ප්‍රතිපාදනය කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වියදම් වාර්තාව ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වැය විෂයන් 88ක් යටතේ ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදන අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමෙන් තොරව සලසා තිබූ මුදල් ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 98ක් දක්වා පරාසයකින් එකතුව රු. 40,270,395ක් ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | වියදම් සිදුකිරීමේදී පිරිමැසුම්දායක බව පවත්වාගෙන යාම, ඇතැම් අමාත්‍යාංශ විසින් සලසා තිබූ මූල්‍ය ප්‍රතිපාදනවලට මුළුමනින්ම වියදම් දැරීමට සිදුනොවීම, ඉල්ලීම් කළ මුළු අක්මුදල් ප්‍රමාණයම භාණ්ඩාගාරය විසින් ලබානොදීම වැනි හේතූන් නිසා එම ඉතිරිවීම් පැවැති බව. | ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට පියවර ගතයුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වියදම් වාර්තාව ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වැය විෂයන් 13ක් යටතේ ලබාදුන් මුදල් ප්‍රතිපාදන මුළුමනින්ම උපයෝජනය කිරීමෙන් තොරව එකතුව රු.977,265ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | ඇතැම් අමාත්‍යාංශ විසින් ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදන වර්ෂ අවසාන ලැබීම වැනි හේතු නිසා අමාත්‍යාංශ විසින් ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදන සඳහා සම්පූර්ණ වියදම් දැරීමට සිදු නොවූ බව. | -එම- |

## 2.4 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුසලි සමෘද්ධි බැංකු මුදල් අයකැමි විසින්, බැංකු කවුන්ටරයේ ප්‍රතිලාභීන්ගේ සෘජු පැමිණීම හා පුද්ගල අනන්‍යතාව ආදිය තහවුරු කර නොගෙන මුදල් රෙගුලාසි 139ට පටහැනිව ප්‍රතිලාභීන් වෙත රු.3,392,000ක් ලබාදී තිබුණ අතර, මෙම මුදල අදාල නිලධාරියා විසින් වැරදි සහගත ලෙස භාවිතා කිරීමෙන් පාඩුවක් සිදුකළ බවට තහවුරු වී තිබුණි. ඒ අනුව එම මුදලින් රු.2,650,000ක් අයකර තිබූ නමුත්, ඉතිරි රු.942,000ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් අයකර නොතිබුණි. | මුසලි ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමෘද්ධි බැංකුව විසින් සිදුකළ ඇතැම් ගනුදෙනු පිළිබඳව සම්පූර්ණ පැහැදිලි කිරීම් එම බැංකුවෙන් ලබාගෙන කඩිනමින් යැවීමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව, අදාල ප්‍රතිලාභීන්ගේ පුද්ගල අනන්‍යතාව තහවුරු කර ගෙවීම් සිදුකළ යුතු අතර, තවදුරටත් අයවිය යුතු මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.5 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සේවය අත්හිටවූ, සේවය හැර ගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 04කගේ සේවක හිඟණය ශේෂ එකතුව රු.520,841ක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිශිෂ්ඨයේ 4 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට පසුගිය වර්ෂ 01 සිට 05ක් දක්වා කාලයක් තුළ සුදුසු පියවර ගෙන නොතිබුණි. | හිඟණය ශේෂ අයකර ගැනීමට පියවර ගෙන ඇති බව. | ආයතන සංග්‍රහයේ XXIV පරිශිෂ්ඨයේ 4 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සුදුසු පියවර ගත යුතු වේ. |

## 2.6 තැන්පතු ගිණුම් ශේෂ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් රඳවා ගත් තැන්පතු 119ක එකතුව රු.4,001,588ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ක්‍රියාමාර්ග නොගෙන පසුගිය වර්ෂ 02කට අධික කාලයක් පොදු තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. | ඇප තැන්පතු ආපසු ලබාගැනීම සඳහා අදාල අයට ලිපි මගින් දැනුම් දී තිබුණත් ලබානොගත් ඇප තැන්පතු රජයේ ආදායමට මාරුකිරීමට කටයුතු කළ බව. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | විවිධ කාර්යයන් සඳහා ලැබී තැන්පත් ගිණුම් ශීර්ෂ 02ක් යටතේ තැන්පත් කර තිබූ එකතුව රු. 4,125,661ක තැන්පතු 66ක් මාස 03 සිට 40ක් නිෂ්කාර්යව පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා තිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව. | නියමිත අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

## 2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, එකතුව රු.1,889,938ක් වටිනා චෙක්පත් 49ක් වර්ෂ 07ක සිට හඳුනා නොගත් ගෙවීම් ලෙස බැංකු සැසඳුම් ප්‍රකාශයේ පැවැති නමුත් මේ පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් මෙම වංචාව පිළිබඳව පත්කළ විශේෂ කමිටුවේ තීරණය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගනු ලබන බව. | මුදල් රෙගුලාසි 104 -110 ප්‍රකාරව, ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත නොහැකි වීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) අරමුදලින්, මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා ලැබී ඇති රු.මිලියන 17.5ක මූල්‍ය ප්‍රතිපාදනයෙන් කෘෂි සංවිධානවලට යන්ත්‍ර හා ප්‍රතිලාභීන්ට රටකජු බීජ ලබාදී තිබුණි. නියැදි පදනමින් සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී බොහෝ ප්‍රතිලාභීන්ට ලබාදුන් රටකජු බීජවලින් පැල හට ගැනීමේ හැකියාව සියයට 25 සිට සියයට 50ක් දක්වා පමණක් පැවැති බව නිරීක්ෂණය විය. එම නිසා ප්‍රතිලාභීන් බාහිර වෙළෙඳපොලෙන් රටකජු මිලට ගෙන නැවත වගාකර තිබූ හෙයින් බහුතරයක් ප්‍රතිලාභීන්ට මෙම වැඩසටහනින් පූර්ණ ප්‍රතිලාභ ලබාගත නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය. | එම ග්‍රාමීය මට්ටමේ ප්‍රජා සංවිධානය විසින් රටකජු පිරිසිදු කර ප්‍රරෝපන හැකියාව පරික්ෂා කර බෙදාහැරීම තහවුරු කර තිබූ අතර ප්‍රතිලාභීන් විසින් ද සියයට 85ක ප්‍රරෝපණ හැකියාව තහවුරු කර තිබුණු බව | බීජ රටකජු මිලදී ගැනිමේදි එහි ප්‍ර රෝහණ හැකියාව පරීක්ෂාවට ලක්කර සුදුසු බීජ මිලදී ගැනීම් සිදුකළ යුතු වේ. |
| (ආ) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රතිපාදනයෙන් නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු. 6,321,438ක් වැයකර 2021 හා 2022 වර්ෂවල සමෘද්ධි පෝෂණීය බොජුන්හල සහ විකුණුම් මධ්‍යස්ථානය ස්ථාපිත කර තිබූ නමුත් නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර මෙම ගොඩනැගිල්ල ඉදිකර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ළඟාකර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ඉදිරියේ මෙවැනි ඉදි කිරීම් සිදු කිරීමේදී ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළ යුතු බවත්, මේ වනවිට ඉදි කර ඇති සමෘද්ධි පෝෂණීය බොජුන්හල කාර්යක්ෂම ලෙස මෙහෙයවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කෘෂිකර්ම අමාත්‍යාංශයේ රු. මිලියන 9.9ක මූලා ප්‍රතිපාදන යටතේ නොදියුණු ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම සඳහා 2023 වර්ෂයේ යෝජිත එළුවන් අභිජනන ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභීන් 120කට ලබාදුන් ගැහැණු එළුවන් 360කින් 2024 මැයි 06 දින වනවිට ලබාදුන් එළුවන් 20ක් දින 14ක් තුළ රෝගාබාධ හේතුවෙන් මියගොස් තිබූ බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. එසේ වුවත්, ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, සැපයුම්කරු විසින් මියගිය එළුවන් වෙනුවට අළුතින් එළුවන් මේ දක්වා ලබානොදීම හේතුවෙන් අපේක්ෂා කළ ප්‍රතිලාභ ළඟාකර ගත නොහැකිවී තිබුණි. | සැපයුම්කරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතින බව | ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, සැපයුම්කරු වෙතින් මියගිය එළුවන් වෙනුවට අළුතින් එළුවන් ලබාගැනීමට පියවර ගතයුතු වේ. |

**3.2 කළමනාකරණ දුර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මන්නාරම දිස්ත්‍රික් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ වූ සමෘද්ධි බැංකු 09ක් මගින් සමෘද්ධි සහනාධාර ලබාගන්නා සාමාජිකයින් 622කට ලබාදුන් ණය මුදලින් මාස 03 සිට 30 දක්වා කාලපරිච්ඡේදයක් මාසික ණය වාරික අය කර නොමැති හිඟහිටි ණය ශේෂයේ එකතුව රු.25,160,211ක් වූ අතර එම හිඟ ණය අයකිරීම් පිළිබඳ කාර්යක්ෂම ක්‍රියාමාර්ග කිසිවක් සමෘද්ධි කළමනාකරුවන් හා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් විසින් ගෙන නොතිබුණි. | හිඟහිටි ණය සම්බන්ධයෙන් ප්‍රතිලාභීන්ට උපදෙස් ලබාදී අයකිරීම් සිදුකරමින් පවතී. තවදුරටත්, අයකළ නොහැකි ප්‍රතිලාභීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ප්‍රගති සමාලෝචන කමිටුවේදී දිස්ත්‍රික් ලේකම් වරයා විසින් ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් ලබාදී කටයුතු සිදුකරමින් පවතින බව. | ලබාදුන් ණය, ගිවිසුම් ප්‍රකාරව මාසිකව අයකර ගැනීමට සුදුසු පියවර ගතයුතු වේ. |
| (ආ) | මන්නාරම දිස්ත්‍රික් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ වූ සමෘද්ධි බැංකුවල බැංකු ගිණුම් පරීක්ෂාවට ලක්කිරීමේදි ප්‍රතිලාභින් සඳහා මාසික සමෘද්ධි ගෙවීම් සමෘද්ධි බැංකු ගිණුමෙහි අඛණ්ඩව තැන්පත් කර තිබූ නමුත් ප්‍රතිලාභීන් 223ක් එකතුව රු.17,739,811ක් මාස 10 සිට 48ක් දක්වා ආපසු නොගෙන තම අවශ්‍යතා සඳහා උපයෝජනය කර නොතිබුණ බව නිරීක්ෂණය විය. ඒ අනුව සහනාධාර අවශ්‍යතාවයක් නොමැති ප්‍රතිලාභීන් තෝරාගෙන තිබූ බව නිරීක්ෂණය විය. | වර්තමානය වන විට මේවා තහවුරු කර සුදුසු අයට ලබාදීමටත් අනෙකුත් අයට ලබාදීම නැවැත්වීමටත් ක්‍රියාකරමින් පවතින බව. | සමෘද්ධි ප්‍රතිලාභීන් තේරීම නිර්ණායක අනුව සිදු කිරීමටත් විධිමත් පරීක්ෂාවක් සිදු කර අනවශ්‍ය පුද්ගලයින් ඉවත් කර ප්‍රතිලාභ අවශ්‍යම පුද්ගලයන්ට ලබා දීමට පියවර ගත යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුමත කළ කාර්ය මණ්ඩලය 667ක් වුවද, සමාලෝචිත වර්ෂය අවසානයේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 177ක්ද සංවර්ධන නිලධාරීන්ගේ 69ක අතිරික්තයක්ද පැවැතුණි. | රජය විසින් දිවයින පුරා ක්‍රියාත්මක කළ රැකියා විරහිත උපාධිධාරීන්ට ස්ථිර පත්වීම් ලබාදීමේ වැඩසටහන යටතේ ස්ථිර පත්වීම් ලබාදීම මත අතිරික්ත 69ක් මතුවිය. මේ පිළිබඳව ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ඉල්ලීමට අනුව අප විසින් නව තනතුරු ස්ථාපිත කිරීමේ යෝජනා අමාත්‍යාංශය වෙත යවා ඇති බව. | පුරප්පාඩු පිරවීමට කාලීනව පියවර ගත යුතු අතර අතිරික්ත කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. |